2

Article 12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019 - 10 - 17 |

පැමිණිලිකාර පාර්ශවය : ඩබ්ලිව්.පී.සී.කේ. අතපත්තු මයා,
අංක 36/17, සීමන්ස් පාර,
මරදාන, කොළඹ 10.

වගඋත්තරකාර පාර්ශවය : 01. විදුහල්පති,
ආනන්ද විද්‍යාලය,
කොළඹ 10.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/2403/18</u>

උක්ත පැමිණිලිකරු විසින් ඉහත පැමිණිලි අංකය යටතේ 2018-09-27 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2019 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා තම පුත්‍රයා වන තිසෙව් මෙත්දුක අතපත්තු දරුවා ඇතුළත් කර ගැනීම සඳහා 24/2018 චක්‍රලේඛය පරිදි පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් යන ගණය යටතේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව CO 764 යටතේ 2018-08-21 වන දින සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවූ බවත්, එම සම්මුඛ පරීක්ෂණයේදී තමාගේ පදිංචි ස්ථානයට අදාලව තවත් බදු ඔප්පුවක් ලියාපදිංචි වී ඇති බවට කරුණු දක්වමින් එම සම්මුඛ පරීක්ෂණයේදී තම පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලියාපදිංචි බදු ඔප්පුව සඳහා කිසිදු ලකුණක් ලබා නොදුන් බවත්ය. මීට අමතරව අදාළ සම්මුඛ පරීක්ෂණයේදී තමා ඉදිරිපත් කරන ලද අනෙකුත් ලේඛන සඳහාද ලකුණු ලබා දීමට කටයුතු නොකළ බවත් සඳහන් කර ඇත.




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

එසේම තමා පදිංචි නිවස දෙමහල් නිවසක් වන අතර, එහි ඉහළ සහ පහළ මහල වෙන වෙනම නිවසේ හිමිකරු විසින් බද්දට ලබා දී ඇති බවත්, කෙසේ වෙතත් මෙම මහල් දෙක සඳහාම ඇත්තේ එකම ගෘහ අංකයක් බවත්, (36/17) ඒ අනුව ඡන්ද හිමි නාම ලේඛනයේ මෙම නිවාස දෙකම එකම ගෘහ අංකයක් යටතේ ලියාපදිංචි කර ඇති බවත්, පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. තැපැල් ලිපිනයට අදාලව එකම ගෘහ අංකය යටතේ නිවසේ හිමිකරු විසින් පවත්වාගෙන යන බැවින්, තමාගේ සහ පහළ මහලේ පදිංචි වී සිටින පදිංචිකරුවන්ගේ බදු ඔප්පුවෙහිද එකම ගෘහ අංකය ඇතුලත්ව ඇති බවද ඒ අනුව දේපලෙහි හිමිකරු විසින් නිවාස ඒකක දෙක සඳහා වෙන වෙනම ගෘහ අංක ලබා ගැනීමට උනන්දුවක් නොදැක්වීම මත තමන්ට මෙම ගැටළුව පැනනැගී ඇති බවත්, අදාල සම්මුඛ පරීක්ෂණයේදී තමා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ඇතුලු සාමාජිකයින් වෙත මෙම තත්ත්වය සාක්ෂි සහිතව සනාථ කරනු ලැබූ අතර, ඒ අනුව 2018-09-04 දින තමාව නැවත සම්මුඛ පරීක්ෂණයකට කැඳවන ලද බවත් සඳහන් කර ඇත.

එහිදී තමා විසින් ප්‍රදේශයට අදාල ග්‍රාම නිලධාරිවරයා විසින් මේ සම්බන්ධව ලබා දෙන ලද තහවුරුවද ඇතුලු අතිකුත් දිවුරුම් ප්‍රකාශද සහිත කරුණු ඉදිරිපත් කිරීමක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සිදුකරන ලද බවත්, ඔවුන් ඒ සම්බන්ධයෙන් සැලකිල්ලක් නොදක්වමින් තමා ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකල බවත් සඳහන් කර ඇත. මෙම තත්ත්වය තුළ තම දරුවා මෙම වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා තිබූ අවස්ථාව එහි විදුහල්පතිවරයා ඇතුලු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අහිමි කර ඇති බවත්, නිවසේ හිමිකරුගේ පාලනය යටතේ පවතින තමාගේ පාලනයෙන් බැහැර කාරණයක් අරඹයා අයුක්තිසහගත ලෙස කටයුතු කිරීමෙන් ඉහත වගඋත්තරකාර පාර්ශවය විසින් තම මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙසත් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම =:

මෙම පැමිණිල්ලට අදාලව කොමිෂන් සභාව මගින් සිදු කර ඇති වාර්තා කැඳවීමට අනුව 2019-02-28 දාතමින් ලිඛිත ප්‍රතිචාර දක්වන විදුහල්පති කොළඹ ආනන්ද විද්‍යාලය, එස්.එම්. කීර්තිරත්න මහතා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු සඳහන් කරන ආකාරයට ඔහු විසින් තම පුත්‍රයා 2019 වසරේ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා ඇතුලත් කිරීමට 36/17 සිමන්ස් පාර, මරදාන, කොළඹ 10 යන ලිපිනයෙන් පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම් කර තිබූ බවත්, ඒ අනුව ඒ සඳහා 2018-08-21 වන දින කැඳවා තිබූ සම්මුඛ පරීක්ෂණයේදී 24/2018 චක්‍රලේඛනයෙහි 7.4.2 වගන්තිය පරිදි තම පදිංචිය තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන ලේඛනය වන 2014-07-28 දින ලියාපදිංචි කරන ලද අංක 1140

දරණ බදු ඔප්පුව සහ 2016-08-03 දින ලියාපදිංචි කරන ලද අංක 1480 දරණ බදු ඔප්පු සහ ඊට අදාළ පත්‍රිකා පරීක්ෂා කිරීමේදී, අංක 36/17 දරණ දේපළ අයදුම්කරුගේ නමට 1480 බදු ඔප්පුව මගින් ලියාපදිංචි කරන දිනය වන විට 2016-02-10 වන දින අංක 4643 දරණ බදු ඔප්පුව මගින් 2016-01-01 දින සිට 2019-12-31 දක්වා වෙනත් පාර්ශවයකට බදු දී ඇති බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිරීක්ෂණය කර ඇති බවට දක්වා ඇත. එම බදු අයිතිය අවලංගු නොකොට මෙම අයදුම්කරුගේ නමට නැවත බදු ඔප්පුවක් මගින් අදාළ දේපළ පැවරීමක් සිදු කර ඇති බවත්, එම තත්ත්වය මත මෙම අයදුම්කරු වෙත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2018-06-30 දිනය වන විට 36/17 සිමන්ස් පාර, මරදාන ලිපිනයෙන් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට නීතිමය හිමිකමක් නොමැති බව ප්‍රකාශ කර ඇත. මෙම තත්ත්වය මත 24/2018 චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි පදිංචිය තහවුරු කිරීම සඳහා අදාළ ලේඛන නොමැති වීම මත ඉන් ඉදිරියට යාමට අවස්ථාවක් ලැබී නොමැති බැවින්, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය සඳහා ලකුණු ලබා දීමට කටයුතු කර නොමැති බව සඳහන් කර ඇත.

මින් පසුව පැමිණිලිකරු විසින් ඒ සම්බන්ධයෙන් අභියාචනා විරෝධතා මණ්ඩලය වෙතද කරුණු ඉදිරිපත් කර ඇතත්, තමා විසින් ඉහත සඳහන් කර ඇති කරුණු මත පදනම්ව අභියාචනා විරෝධතා මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් විසින් පැමිණිලි පාර්ශවයේ අභියාචනය නැවත ප්‍රතික්ෂේප කර ඇත. මෙම තත්ත්වය මත තමන් කටයුතු කර ඇත්තේ 24/2018 චක්‍රලේඛනයට අනුකූලව බව පවසන අතර, නීතියට පටහැනිව කටයුතු කිරීමක් මෙහිදී සිදු කර නොමැති බැවින් පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සිදු කර නොමැති බව වගඋත්තරකරු විසින් වැඩිදුරටත් පෙන්වා දී ඇත.

දෙවන වගඋත්තරකාර අධ්‍යාපන අමාත්‍යාංශයේ කරුණු දැක්වීම :-

ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් විමර්ශනය සඳහා සහභාගී වී ඇති සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ නීතිඥ ප්‍රදීප් නිශාන්ත මහතා 2019-02-14 වන දින පැවැති පරීක්ෂණයේදී සඳහන් කර ඇත්තේ, පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාළව තම අමාත්‍යාංශය මගින් පිහිටුවා ඇති අභියාචනා කමිටුව වෙත පැමිණිලිකරු කරුණු ඉදිරිපත් කර ඇති බැවින්, ඒ සම්බන්ධ ඉදිරියේදී අදාළ කමිටුව විසින් කරුණු සලකා බැලීමක් සිදු කිරීමට නියමිත බවයි. කෙසේ වෙතත් ඒ ඒ වසර වල පළමු ශ්‍රේණි සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළව කටයුතු කිරීමේදී අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සහ අභියාචනා විරෝධතා මණ්ඩල වෙත අවශ්‍ය බලතල හා වගකීම් පවරා ඇති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

විමර්ශනය :-

මෙම පැමිණිල්ල සම්බන්ධව වැඩිදුර විමර්ශන 2019-02-14 සහ 2019-04-25 යන දිනවල සිදුකර ඇති අතර, පළමු වගඋත්තරකරු වන විදුහල්පති, කොළඹ ආනන්ද විද්‍යාලය නියෝජනය කරමින් පැමිණි නියෝජිතයා විසින් වැඩිදුර විමර්ශනයේදී මෙම පැමිණිල්ලේ ප්‍රශ්නගත කාරණයට අදාලව ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම සනාථ කරමින් කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව තමන් විසින් මෙහිදී කටයුතු කර ඇත්තේ 24/2018 චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි බව ලේඛන ආශ්‍රයෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

පැමිණිලි පාර්ශවය විසින් වැඩිදුර විමර්ශනයේදී ලිඛිත හා වාචික කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම ප්‍රශ්නගත දේපළ හා සම්බන්ධ අදාළ බදු ඔප්පු සහ බදු ගිවිසුම් ආදි සියල්ල තමා විසින් සාක්ෂි සහිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බවත්, මෙම පදිංචි ස්ථානයේ සිටම තමන් විසින් කොළඹ නාලන්දා විද්‍යාලය වෙත මෙම ගණය යටතේම ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය සලකා බලමින් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු ලබා දීමක් සිදු කර ඇති බවත්, ඒ අනුව ආනන්ද විදුහලේ විදුහල්පතිවරයා ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 24/2018 චක්‍රලේඛනයට පටහැනිව කටයුතු කර ඇති බවත්, තමන් ඉදිරිපත් කරන ලද ලේඛන සලකා බලා නිවැරදිව ලකුණු ලබා දුන්නේ නම් තමන් වෙත ලකුණු 63ක් හිමිවන බවත්ය. ප්‍රශ්නගත නිවසේ මහල් දෙකක පවුල් දෙකක් පදිංචිව සිටින බවට පැහැදිලිව ග්‍රාම නිලධාරිවරයා, මැතිවරණ දෙපාර්තමේන්තුව, දේපළ හිමිකරු ඇතුළු පාර්ශවකරුවන් දිවුරුම් ප්‍රකාශ ආදිය මගින් ප්‍රකාශ කර තිබියදී ස්ථාන පරීක්ෂාවක් මගින් තමාගේ පදිංචිය පිළිබඳව තහවුරු කර ගැනීමට අවස්ථාව තිබියදී අත්තනෝමතික ලෙස වගඋත්තරකාර පාර්ශවය මෙහිදී කටයුතු කිරීම මගින් තමන්ට බලවත් අගතියක් සිදුව ඇති බවයි.

මෙහිදී 36/17, සීමන්ස් පාර, කොළඹ 10 ලිපිනය සඳහා වරිපනම් අංක එකක් පැවතුනත් අදාළ නිවසෙහි මහල් දෙකෙහි පවුල් දෙකක් පදිංචිව සිටින බවට සහ විශේෂයෙන්ම තමන් 2014 වර්ෂයේ සිට අදාළ ලිපිනයෙහි පදිංචි ව සිටින බවට බදු ඔප්පු මගින් පැහැදිලිව සනාථ කර ඇති බවත්, කිසිදු ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීමක් මෙහිදී සිදු කර නොමැති බවත්, බදු ඔප්පු පිටපත් සහිතව කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත.

පළමු පරීක්ෂණ අවස්ථාවේදී පාර්ශවකරුවන් විසින් පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු අනුව පරීක්ෂණ නිලධාරි වගඋත්තරකාර පාර්ශවයට යෝජනා කර ඇත්තේ ආනන්ද විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත මෙම කාරණය සම්බන්ධව නැවත අවධානය යොමු කරවා පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන පරිදි සත්‍ය වශයෙන්ම මෙම අයදුම්කරු ඇතුළු පවුලේ

සාමාජිකයින් ඉහත ලිපිනයෙහි පදිංචිව සිටින බවට සහ එකම ගෘහ අංකයක් යටතේ වුවද දෙමහල් නිවසේ පවුල් ඒකක දෙකක් පදිංචිව සිටින බවට තහවුරු කර ගැනීමක් ස්ථාන පරීක්ෂාවක් මගින් සිදු කර ගත හැකි බවයි. ඒ අනුව ඒ සඳහා විදුහල්පතිවරයා වෙනුවෙන් පැමිණි නියෝජිත මහතා තම එකගතාවය පළ කර ඇතත්, ඒ අනුව ක්‍රියාකර නොමැති බව පැමිණිලිකාර පාර්ශවය පසුව කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.

නිරීක්ෂණ :-

මෙම පැමිණිල්ලට අදාළව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී පැමිණිලි පාර්ශවය සහ වගඋත්තරකරුවන් ඉදිරිපත් කරන ලිඛිත හා වාචික කරුණු අනුව විශේෂයෙන් පැමිණිලි පාර්ශවය සඳහන් කරන පරිදි ඔවුන් තම දරුවා ආනන්ද විද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සලකා බලා ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු පිරිනැමීමක් සිදු කිරීමට හැකියාව තිබූ බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම ඒ ආසන්නයෙන්ම පිහිටා තිබෙන කොළඹ, නාලන්දා විද්‍යාලය වෙත ඉහත ගණය යටතේම පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර තිබූ අයදුම්පත සලකා බලා ලකුණු පිරිනැමීමක් සිදු කර ඇති බව පැමිණිලි පාර්ශවය විසින් සාක්ෂි සහිතව සනාථ කර ඇත. පැමිණිලිකරු 1140 සහ 2014-07-28 දින දරණ බදු ඔප්පුව මත පළමුවෙන් මෙම දේපලේ පදිංචියට පැමිණ ඇති අතර, ඉන්පසුව එකී බදු ඔප්පුවේ කාලය අවසන් වීමත් සමගම දෙවන බදු ඔප්පුවක් (1480/ 2018-08-03) ලියාපදිංචි කර ඇත.

දෙවන බදුකරු පදිංචියට පැමිණෙන විටද පැමිණිලිකරු පදිංචිව සිට ඇති අතර, දෙවන බදුකරුවෙකු සේ පැමිණීමෙන් පැමිණිලිකරුට ඇති නීතිමය හිමිකම අහිමි වීමක් සිදු නොවේ. මන්ද යත්, ඔහු 2014-07-28 දිනැති බදු ඔප්පුව මත පදිංචියට පැමිණ ඇති නිසා වේ. එකී ඔප්පුවේ කාලය දීර්ඝ කර ගැනීමක් පමණක් 1480 මගින් 2016-08-03 දින සිදු කර ගෙන ඇති නිසා වේ.

එමෙන්ම දෙවනුව පැමිණි බදුකරුවන්ගේ දරුවෙකු එකී ලිපිනයේ පදිංචිය පෙන්වමින් ආනන්ද විද්‍යාලය වෙත ඇතුළත්වීමේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව විමර්ශනයේදී වගඋත්තරකාර පාර්ශවය අනාවරණය නොකරයි.

පැමිණිලිකරුගේ අංක 1140 දරණ පළමු බදු ඔප්පුව අවලංගු නොකර තිබියදී දෙවන බදුකරුගේ ඔප්පුව වන අංක 4643 දරණ ඔප්පුව වෙනත් පාර්ශවයක් වෙත ලියාපදිංචි කර ඇත. වගඋත්තරකාර ආනන්ද විද්‍යාලය ප්‍රකාශ කර ඇත්තේ, අංක 4643 දරණ ඔප්පුව අවලංගු නොකර පැමිණිලිකරුගේ බදු ඔප්පුව වන 1480 දරණ බදු ඔප්පුව ලියාපදිංචි කර ඇති නිසා

මෙම පැමිණිලිකරුට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2018.06.30 දිනට වන විට 36/17 සීමන්ස් පාර, මරදාන කොළඹ 10 ලිපිනයෙන් අයදුම් කිරීමට නීතිමය හිමිකමක් නොමැති බවයි.

ඒ අනුව දෙවන බදුකරුගේ අයිතිය අවලංගු නොකර ලියන ලද 1480 ඔප්පුව මගින් දේපල පවරා ඇති නිසා අදාල ලිපිනයෙහි අයදුම් කිරීමට නීතිමය හිමිකමක් නැති බව දක්වා ඇත.

නමුත් එකී දෙවන බදුකරුගේ ඔප්පුවද ලියාපදිංචි කරන විට පැමිණිලිකරුගේ පලමු බදු කාලයට අයත් 1140 දරණ ඔප්පුව අවලංගු කිරීමක් සිදු කර නැත. ඒ නිසා 2 වන බදුකරුගේ අයිතියද පැමිණිලිකරුගේ 1480 ඔප්පුව මගින් යටපත්ව පැමිණිල්ලකරුට බදු අයිතියේ ප්‍රමුඛතාවය හිමිව ඇත. ඒ නිසා එම 1480 දරණ ඔප්පුව මත අයදුම් කිරීමට නීතිමය හිමිකම අහිමි නොවන බව නිරීක්ෂණය වේ.

තවද 2018 ජනවාරි මස වන විට 2 වන බදු ඔප්පුවෙහි අයිතිකරු මෙම පරිශ්‍රයේ පදිංචිය හැර ගොස් බද්ද අවලංගු කිරීමේ ඔප්පුවක්ද ලියාපදිංචි කර ඇති බවට කරුණු සනාථ කිරීමට පැමිණිලිකරුට හැකියාවක් පවතී. එසේ හෙයින්ද පැමිණිලිකරුගේ අයදුම් පත්‍රය පිළිබඳව නැවත සලකා බැලීමක් කළ යුතු බව නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන පරිදි චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අංක 36/17, සීමන්ස් පාර, මරදාන, කොළඹ 10 ලිපිනයෙන් තම දරුවා ආනන්ද විදුහලේ පලමු ශ්‍රේණියට ඇතුලත් කිරීමට නීතිමය හිමිකමක් නොමැති බවට ඉදිරිපත් කරන කරුණුද පිළිගත නොහැකි බව පැමිණිලි පාර්ශවය විසින් වැඩිදුරටත් පැහැදිලි කර ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගැනීමේදී වගඋත්තරකාර පාර්ශවය වන විදුහල්පති, කොළඹ ආනන්ද විද්‍යාලය ඇතුළු 2019 වසරේ පලමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරීමට අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා මණ්ඩල සාමාජිකයින්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂාකොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිගමනය :-

ඉහත කරුණු අනුව පැමිණිලිකරු වන ඩබ්.පී.සී.සී. අතපත්තු මහතා විසින් තම පුත්‍රයා වන තිසෙව් මෙත්සුක අතපත්තු දරුවා 2019 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පලමු ශ්‍රේණියට ඇතුලත් කර

ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය කිසිදු ලකුණක් ලබා නොදීම මගින් පැමිණිලි පාර්ශවය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට වැඩිදුර විමර්ශනයේදී තහවුරු වී ඇත.

නිර්දේශය :-

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය නැවත සලකා බලා ඔහු විසින් ඒ සමග ඉදිරිපත් කර ඇති ලේඛන සඳහා ලකුණු ලබා දීමක් සිදු කර ඉහත සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ අවස්ථාවේදී ලකුණු පිරිනමා ඇති ආකාරයට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ පැමිණිලිකරුගේ පුත්‍රයා ආනන්ද විද්‍යාලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට අවශ්‍ය කඩයිම් ලකුණ හෝ එම සීමාව ඉක්මවා ලකුණු ලබා ගන්නේ නම් ඒ අනුව එම දරුවා පාසලට ඇතුලත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතු බවට වගඋත්තරකරුවන් වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.11-29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවෙගම,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත:- ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/